ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1991 අංක 36 දරන
# කුඩා තේවතු සංවර්ධන
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1991 අගෝස්තු මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1991 අගෝස්තු මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1991 අංක 36 දරන කුඩා තේ වතු සංවර්ධන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1991 අගෝස්තු මස 28 වන දින]

එල්. ඩී.—ඕ. 9/90

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1991 අංක 36 දරන කුඩා තේ වතු සංවර්ධන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනතේ 15 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඔ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන පනතේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඔඔ) මේ පනතේ විධිවිධානවලට යටත්ව, (මෙහි මින් මතු "සමිති" යනුවෙන් සඳහන් කරනු ලබන) කුඩා තේ වතු සංවර්ධන සමිති ලියාපදිංචි කිරීම සඳහා, ලියාපදිංචි කිරීම උදෙසා ඉල්ලුම් කිරීම සඳහා, ඒ සමිති ලියාපදිංචි කළ යුත්තේ කවර කොන්දේසිවලට සහ සීමා කිරීම්වලට යටත්වද ඒ කොන්දේසි සහ සීමාකිරීම් සඳහා, ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අභියාචන ඉදිරිපත් කිරීම සඳහා, (සමිතිවල සහ ඒවායේ විධායක කමිටුවල සාමාජිකත්වය සඳහා තිබිය යුතු සුදුසුකම්, සමිතියේ සාමාජික නාමලේඛනය, සමිතියේ ලාභ ප්‍රකාශයට පත් කිරීම, සමිතියේ සහ විධායක කමිටුවේ රැස්වීම්, සමිතියේ ගිණුම් සහ ගිණුම් විගණනය කිරීම්, සමිතිය සහ එහි සාමාජිකයකු අතර සමථයට පත් කර ගැනීම ඇතුළුව) ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කරන සමිතිවල අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කළ යුතු විධිවිධාන සඳහා, ලියාපදිංචි කිරීම අවලංගු කිරීමේ හේතු සඳහා සහ අවලංගු කිරීමේ නියමයන්ට විරුද්ධව අභියාචන ඉදිරිපත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වෙන රීති සෑදීමට;".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) මේ පනත යටතේ නියෝග සෑදීමට නියම කර ඇති හෝ නියමිත යයි මේ පනතින් නියම කර ඇති හෝ සියලු කාරණා

සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එම නියෝගය, එසේ පළ කරන ලද දිනයේ දී හෝ එහි නිශ්චිතව සඳහන් යම් පසු දිනයක හෝ ක්‍රියාත්මක වන්නේ ය. ".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.